විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 03/2019

මාගේ අංක: විවැ/චක්‍රලේඛ 2019
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2019.11.08

පොලිස්පති,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා
සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

## පොලිස් නිලධාරීන් සඳහා දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම

පොලිස් දෙපාර්තමේන්තුවේ ආබාධිත නිලධාරින්ටද දුබලතා විශ්‍රාම වැටුප 50/60 සීමාව නොසලකා විශ්‍රාම වැටුප් ගණනයට ගනු ලබන වැටුපේ 100% සීමාවෙන් නොඉක්මවන පරිදි ගෙවීමට 2019/10/09 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව පහත උපදෙස් පරිදි කටයුතු කල යුතුය.

1. මෙම ගෙවීම් 2018.01.08 දින සිට ක්‍රියාත්මක වූවා සේ සැලකිය යුතුය. (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 (සංශෝධන II) අනුව ත්‍රිවිධ හමුදා නිලධරයන්ට දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම් කරන ආකාරයට ගෙවීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්.)

2. දුබලතා ප්‍රදාන පත්‍රයක් ලද විට ප්‍රාදේශීය ලේකම් මඟින් එය අදාල  නිලධාරියාගේ සේවා විශ්‍රාම වැටුපට අදාල ගොනුවටම ඇතුලත් කල යුතුය. එලෙස සේවා විශ්‍රාම වැටුපට අමතරව දුබලතා විශ්‍රාම වැටුප් හිමි වන විශ්‍රාමිකයින්ගේ ගොනු වෙනමම සලකුණු කර තබා ගත යුතුය.

3. මෙලෙස ලැබෙන අයදුම්පත් වලට අදාලව දුබලතා විශ්‍රාම වැටුප 2018/01/08 දින සිට හිඟ වැටුප සමඟ ගණනය කර විශ්‍රාම වැටුප සංශෝධනය සඳහා අනුගමනය කරන ක්‍රමවේදය අනුගමනය කරමින් (එහි reason සඳහා Police Disable Allowance AB ලෙස තොරතුරු ඇතුලත් කර) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කල යුතුය.මෙම දුබලතා වැටුප දත්ත පද්ධතියේ DSA යටතේ දීමනාවක් ලෙස සටහන් කළ යුතුය. මෙහිදී සේවා විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ හා දුබලතා ප්‍රදාන පත්‍රයේ  පිටපතක් scan කර එවීමට  කටයුතු කල යුතුය.

4. මේ පිළිබඳ යම් ගැටලුවක් මතුවන සෑම අවස්ථාවකදීම මවෙතින් පැහැදිලි කර ගැනීමක් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

5. මෙය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාව මත නිකුත් කරනු ලැබේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ග.ස.
2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු.දැ.ග.ස.
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ග.ස
4. විගණකාධිපති - කරු.දැ.ග.ස.